සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 81 | S | I |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ......................................... කෘෂි හා ආහාර තාක්ෂණය - I කාලය : පැය 01යි.

සැලකිය යුතුයි.
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

01. ඈත අතීතයේ මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍ය ආහාර ඇඳුම්, ඖෂධ වැනි දෑ කෘෂිකර්මය ආශ්‍රිතව තමා විසින්ම සපයා ගත්හ. මෙම ක්‍රමය හඳුන්වන්නේ,
(1) යැපුම් කෘෂිකර්මාන්තය ලෙසය. (2) ස්වයංපෝෂිත කෘෂිකර්මාන්තය ලෙසය.
(3) ග්‍රාමීය කෘෂිකර්මාන්තය ලෙසය. (4) වානිජ කෘෂිකර්මාන්තය ලෙසය.

02. කෘෂිකාර්මික කටයුතු සඳහා රජවරු වැව් රැසක් ඉදිකළ බැවින් වැව් බැඳි රාජ්‍යය ලෙස හැඳින්වූයේ අතීත ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශය ද?
(1) උඩරට ප්‍රදේශය (2) රජරට ප්‍රදේශය (3) මැදරට ප්‍රදේශය (4) මතුරට ප්‍රදේශය

03. අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය ප්‍රමාණවලින් අවශ්‍ය ආහාර වර්ග ගුණාත්මක බවින් යුතුව ලබා ගැනීමට ඇති හැකියාව හඳුන්වනු ලබන්නේ,
(1) ආහාර සුලභතාවය වශයෙනි. (2) ආහාර පරිරක්ෂණය වශයෙනි.
(3) ආහාර සුරක්ෂිතතාවය වශයෙනි. (4) ආහාර වැඩි දියුණු කිරීම වශයෙනි.

04. අතීතයේ දී වැවක වැව් බැම්මට ජලය මගින් ඇතිවන පීඩනය අවම කරමින් වැව් බැම්ම ආරක්ෂා කිරීමට ඉදිකරන ලද සුවිශේෂී නිර්මාණය කුමක්දැයි හඳුන්වන්න.
(1) දියකැට පහන (2) සොරොව්ව (3) සළපනාව (4) බිසෝකොටුව

05. කෘෂි කර්මාන්තයට අයත් ප්‍රධාන ක්ෂේත්‍ර වන්නේ,
(1) බෝග වගාව හා සත්ත්ව පාලනයයි. (2) බෝග වගාව හා වාරිකර්මාන්තයයි
(3) සත්ත්ව පාලනය හා වන වගාවයි. (4) සත්ත්ව පාලනය හා ධීවර කර්මාන්තයයි.

06. වර්ෂාපතන ප්‍රමාණය මෙන්ම මුළු වර්ෂාපතනය පැවැත් වූ කාල සීමාවද නිර්ණය කළ හැකි වන්නේ,
(1) සූර්ය දීප්ත මානය මගිනි. (2) ස්වයංක්‍රීය වර්ෂාමානය මගිනි.
(3) උපරිම අවම උෂ්ණත්ව මානය මගිනි. (4) සරල වර්ෂාමානය මගිනි.

07. ශිෂ්‍යයෙකු විද්‍යාගාරයක් තුළදී සාපේක්ෂ ආර්ද්‍රතාවය මැනීම සඳහා භාවිතා කරනු ලබන උපකරණය කුමක්ද?
(1) උපරිම හා අවම උෂ්ණත්ව මානය (2) පානමානය
(3) ආර්ද්‍රතාමානය (4) අනිලමානය

ශ්‍රී ලංකාවේ එක්තරා නගරයක වර්ෂාපතන ව්‍යාප්තිය දැක්වෙන දළ ප්‍රස්තාර සටහනක් පහත දැක්වේ. ඒ ඇසුරින් 8, 9 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




08. ප්‍රස්තාරයේ Eට සහ J ට අදාළ මාස විය හැක්කේ පිළිවෙළින්
(1) ජනවාරි සහ අප්‍රේල් ය. (2) මාර්තු සහ නොවැම්බර්ය
(3) පෙබරවාර සහ අගෝස්තුය (4) මැයි සහ ඔක්තෝම්බර් ය.

09. ධාන්‍ය බෝගයක අස්වැන්න නෙළීමට වඩාත් යෝග්‍ය මාස වන්නේ
(1) A හා D ය (2) B හා H ය (3) E හා J ය (4) C හා G ය

10. ප්‍රස්තාරයේ පෙන්නුම් කෙරෙන වර්ෂාපතන ව්‍යාප්තිය ඇති නගරය විය හැක්කේ
(1) අනුරාධපුරය (2) ගාල්ල (3) හම්බන්තොට (4) මඩකලපුව

11. ශාකවල පුෂ්ප පිපීම සඳහා වඩාත්ම වැදගත් වන දේශගුණික සාධකය කුමක් ද?
(1) වර්ෂාපතනය ය (2) සුළඟ ය (3) ආලෝකය ය (4) උෂ්ණත්වය ය

12. දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) සුළි සුළං නිසා බෝග අස්වැන්න වැඩිවේ. (2) සුළඟේ වේගය වැඩි විට දී ශාකවල පරාගනය වැඩි වේ.
(3) මඳ සුළඟ නිසා බෝග ගැලවී යා හැක. (4) මඳ සුළඟ පුෂ්ප පර පරාගනයට බොහෝ උදව් වේ.

13. වායුගෝලීය උෂ්ණත්වය ඉහළයාම වර්තමාන ලෝකය මුහුණ පා ඇති ප්‍රධාන පාරිසරික ගැටලුවකි. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙන් ලබා දිය හැකි දායකත්වය වන්නේ,
(1) කැලෑ එළිපෙහෙළි කර කෘෂි වගාවන් ඇති කිරීමය.
(2) කෘෂි රසායනික භාවිතය අවමකර කාබනික වගාව කිරීමය.
(3) නව වන වගා සහ කෘෂි වන වගා ඇති කිරීමය.
(4) වගා කළ හැකි සෑම බිම් අඟලකම වගා කිරීමය.

14. වාර්ෂික වර්ෂාපතනයේ ප්‍රමාණය මෙන්ම ව්‍යාප්තිය ද සලකා ශ්‍රී ලංකාව ප්‍රධාන දේශගුණික කලාප තුනකට වෙන්කර ඇත. මේ අනුව තෙත් කලාපයේ වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණය වන්නේ
(1) මි. මී. 2500 හෝ ඊට වැඩිය (2) මි. මී. 1750 - මි. මී. 2500 අතරය.
(3) මි. මී. 1750 හෝ ඊට අඩුය. (4) මි. මී. 1000 හෝ ඊට අඩුය.

15. පහත දැක්වෙන සාධක සලකා බලන්න.
A - මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය
B - ප්‍රදේශයේ පස් කාණ්ඩයක්
C - අභ්‍යන්තර ජලාශ පිහිටීම
D - මිනිස් ක්‍රියාකාරකම්
එම සාධක අතුරෙන් පරිසර උෂ්ණත්වය කෙරෙහි බලපාන සාධක වනුයේ
(1) B, C හා D ය (2) A හා B පමණි (3) A, C හා D ය (4) A, B, හා C ය

16. ආලෝකයේ විවිධ වර්ණ ශාකවල විවිධ වර්ධක අවස්ථා සඳහා උපකාරී වන බැවින් ආලෝකය හොඳින් ලැබෙන ආකාරයට බෝග වගා කළ යුතුය. මින් ප්‍රභාසංස්ලේෂණයට හිතකර වර්ණ මොනවාද?

(1) නිල් සහ කොළ ආලෝකය ය. (2) නිල් සහ රතු ආලෝකය ය.

(3) නිල් දම් ආලෝකය ය. (4) නිල් සහ සුදු ආලෝකය ය.

17. ශ්‍රී ලංකාවේ ගොවිතැන ප්‍රධාන කන්න දෙකකට අනුව සිදුවේ. ඉන් යල කන්නයට අයත්වන්නේ කුමන මාසද?

(1) මැයි, ජූනි, ජූලි සහ අගෝස්තුය (2) ජනවාරි, පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් ය.

(3) සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර්

(4) නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි සහ පෙබරවාරි ය.

18. ගොවිතැන් කටයුතු සඳහා වර්ෂාපතනය ඉතා වැදගත් වේ. මහ කන්නයට වර්ෂාව ලැබෙන ප්‍රධාන ආකාරය කුමක්ද?

(1) වාසුළි වැසි මගිනි. (2) ඊසාන දිග මෝසම් සුළං වැසි මගිනි.

(3) නිරිත දිග මෝසම් සුළං වැසි මගිනි. (4) සංවහන වැසි මගිනි.

19. ප්‍රභා අවධි සංවේදිතාව අනුව "කෙටි දින ශාක" සිටුවිය යුත්තේ වසරේ කුමන කාලයේ දී ද?

(1) යල කන්නයේ දී ය. (2) ඕනෑම කන්නයකදී ය.

(3) මහකන්නයේ දීය (4) කන්න අතර කාලයේ දීය

20. පොළොව අභ්‍යන්තරයේ අධික උෂ්ණත්වය හා පීඩන යටතේ පවතින මැග්මා විටින් විට පොළොවේ දුර්වල තැන්වලින් හෝ පිපිරීම්වලින් පිටතට පැමිණ ඝනීභවනය වීමෙන් ආග්නේය පාෂාණ සෑදේ.
මින් ආග්නේය පාෂාණය කුමක්ද?

(1) වැලිගල් (2) ග්‍රැනයිට් (3) නයිස් (4) ෂෙල්

21. පාෂාණ —[A]→ මාතෘ ද්‍රව්‍ය —[B]→ පස

පාෂාණ විවිධ ක්‍රියාකාරකම් වලට භාජනය වීමෙන් පසක් නිර්මාණය වේ. මෙම ක්‍රියාවලියේ දී A වලින් පෙන්නුම් කරනුයේ

(1) පාංශු ජනනය ය. (2) බන්ධන කාරකය ය. (3) පාෂාණ ජීර්ණය ය. (4) පාංශු ස්වීකරණය ය.

22. අවසාදිත පාෂාණ සෑදීමේ දී උපයෝගීවන බන්ධන කාරක ලෙස හුණු, යකඩ ඔක්සයිඩ, සිලිකා ආදිය දැක්විය හැකිය. එසේ සෑදුන අවසාදිත පාෂාණය වන්නේ මින් කුමක් ද?

(1) නයිස් (2) පෙග්මටයිට් (3) කිරිගරුඬ (4) හුණුගල්

23. ගොවීන් වගාවකට පෙර විවිධ ස්ථානවල තිබෙන පස් අංශු අතින් ස්පර්ශ කරනු දක්නට ලැබේ. මේ මගින් සොයා ගනු ලබන්නේ පසේ කුමන ගුණාංගය ද?

(1) පාංශු වයනය ය. (2) පාංශු ව්‍යුහය ය. (3) පාංශු වර්ණය ය. (4) පාංශු කලිල ය.

24. බෝග වගාවේ දී ජලයට ඉතා වැදගත් ස්ථානයක් හිමිවේ. ශාකවලට උරාගතහැකි ජල වර්ගය වන්නේ මින් කුමක්ද?

(1) ගුරුත්වාකර්ෂණ ජලයයි. (2) කේශාකර්ෂණ ජලයයි

(3) ජලාකර්ෂණ ජලයයි (4) පාංශු ජලය යි.

25. ශිෂ්‍යයෙකු ක්ෂේත්‍රයේ දී පාංශු වයනය සෙවීම සඳහා තෙත් කළ පස් සාම්පලයක් දෙ අත්ලේ තබා රෝල් කර මුදුවක් ලෙස නවන විට ලැබුණු හැඩය රූපයේ දැක්වේ. මෙම පස,



(1) මැටි පසකි. (2) වැලි පසකි.

(3) වැලි ලෝම පසකි. (4) මැටි ලෝම පසකි

26. ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන එසේම බෝග වගාවට ප්‍රශස්ත ලෙස ජලය සහ වාතය රඳවා ගත හැක මෙන්ම මනා ජල වහනයකින් යුත් ප්‍රධාන පාංශු ව්‍යුහ ආකාරය මින් කුමක්ද?

(1) කැටිති ව්‍යුහය ය. (2) තනිකනිකා ව්‍යුහය ය.

(3) ස්ථම්භික ව්‍යුහය ය. (4) අණුකෝණාකාර කුට්ටි ව්‍යුහය ය.

27. ගාල්ල, මාතර, කොළඹ, ගම්පහ යන තෙත් කලාපීය නගරවල පැතිර පවතින පස් කාණ්ඩය කුමක්දැයි තෝරන්න.

(1) රතු දුඹුරු පස ය. (2) දියළු පස ය.

(3) රතු කහ පොඩ්සොලික් පස ය. (4) රතු කහ ලැටසොලික් පස ය.

28. ජල සම්පාදනයෙන් පසු මහා අවකාශවලට පිරෙන ජලය ගුරුත්වාකර්ෂණ බලය යටතේ පහළට ගලාගිය පසු පවතින පසේ ජල තත්ත්වය හඳුන්වනු ලබන්නේ,

(1) මැලවීමේ අංකය ලෙසය. (2) ක්ෂේත්‍රධාරිතාව ලෙසය
(3) සංතෘප්ත මට්ටම ලෙසය. (4) ස්ථිර මැලවීමේ අංකය ලෙසය.

29. වර්තමානයේ ''සේනා දළඹුවා'' විසින් විශාල ලෙස හානියට පත් කරනු ලබන බෝගය කුමක්ද?

(1) නෝකෝල් (2) සෝයා බෝංචි (3) බඩ ඉරිඟු (4) බූෂිටා

30. පස සෝදායාම වැලැක්වීම සඳහා යොදාගත හැකි පඳුරුමය ශාක දෙකක් නම් කරන්න.

(1) කලාඳුරු, ඉලුක් (2) ගෞතමාලා, ගිණි තෘණ
(3) කහ, ඉඟුරු (4) සේර, සැවැන්දරා

31. හායනයට පත් වූ පසක් නැවත බෝග වගාකළ හැකි තත්ත්වයට පත්කිරීම පාංශු පුනරුත්ථාපනය යන්නෙන් හැඳින්වේ. මෙසේ පාංශු පුනරුත්ථාපනය සඳහා වගා කළ හැකි බෝගයක් නම් කරන්න.

(1) ගෞතමාලා (2) පියුරේරියා (3) සෙන්ට්‍රොසීමා (4) ග්ලිරිසීඩියා

32. පාංශු ඛාදනයේදී පස් අංශු එකිනෙක වෙන්වීම අවම කිරීම සඳහා පස ඉක්මනින් ආවරණය සඳහා වගා කිරීමට සුදුසු බෝග යුගලය තෝරන්න.

(1) වැටකොළු, කරවිල (2) බතල, වට්ටක්කා (3) මෑ, දඹල (4) ගොටුකොළ, කංකුං

33. පාංශු සංරක්ෂණය සඳහා යොදාගනු ලබන යාන්ත්‍රික ක්‍රමයක් වන්නේ මින් කුමක් ද?

(1) දෙවැටි යෙදීම (2) සමෝච්ඡ කුට්ටිකාණු යෙදීම
(3) සමෝච්ඡ රේඛා අනුව වගා කිරීම (4) භෞතික භූමි භාවිත වර්ගීකරණය අනුව සුදුසු බෝගවැවීම

34. පාෂාණ ජීර්ණය සඳහා භාවිතා කළහැකි භෞතික සාධකයක් නොවන්නේ කවර ප්‍රකාශයද?

(1) උෂ්ණත්වය වෙනස් වීම මඟින්
(2) ගලායන ජලය මඟින්
(3) වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් ජලයේ දියවීමෙන් සෑදෙන කාබනික අම්ලය මඟින්
(4) භූමිකම්පා මගින් ඇතිවන අධික චාලක ශක්තිය මගින් පාෂාණ කැබලිවලට කැඩීම

35. වැලි අධික පසකට කාබනික ද්‍රව්‍ය යෙදීම මගින්

(1) පාංශු ව්‍යුහය බිඳවැටේ. (2) ක්ෂුද්‍ර ජීවී ක්‍රියා අඩාලවේ.
(3) ජලය රඳවා ගැනීමේ හැකියාව අඩුවේ. (4) කැටායන හුවමාරු ධාරිතාව වැඩිවේ.

36. ශිෂ්‍යයෙකු පසෙහි අඩංගු ජල වර්ගය පිළිබඳ පරීක්ෂණයක් කළේය. මෙහිදී පස් සාම්පලයක් උඳුනක දමා $105c^o$ උෂ්ණත්වයක් යටතේ පැය 12 - 24ක් පමණ රත්කරන ලදී. මින් සොයාගනු ලැබුයේ කුමන ජල වර්ගය ද?

(1) ගුරුත්වාකර්ෂණ ජලය (2) භූගත ජලය
(3) කේෂාකර්ෂණ ජලය (4) ජලාකර්ෂණ ජලය

37. බෝගවගාව සඳහා සුදුසු වන පසක තිබිය යුතු පාංශු වාතය ප්‍රමාණය කොපමණ ද?

(1) 25%කි. (2) 10%කි. (3) 85%කි. (4) 50%කි.

38. පසෙහි ජීවත්වන ''ක්ෂුද්‍ර ජීවීන්'' කාණ්ඩය තෝරන්න.

(1) ප්‍රෝටොසෝවා, ගැඩවිලා (2) ඇල්ගී, බැක්ටීරියා
(3) දිලීර, වේයන් (4) බිම් ඌරා, නෙමටෝඩා

39. ජලය රැඳෙන පසක සිටුවිය හැකි වඩාත් සුදුසු බෝග වර්ග දෙකකි.

(1) සාරණ, තම්පලා (2) මුගුණුවැන්න, ගොටුකොළ
(3) කංකුං, කොහිල (4) කංකුං, ගොටුකොළ

40. ගුරු මහතෙක් පස් කුට්ටියක් ගෙන පවනේ වියලා එය මීටර් එකහමාරක් පමණ ඉහළ සිට බිමට වැටෙන්නට සැලැස්වීය. පසුව කැඩී බිඳී ගිය පස් කැටිති නිරීක්ෂණය කළේය.
මෙම පරීක්ෂණය කිරීමේ අරමුණ වන්නේ

(1) පාංශු වර්ණය සෙවීම (2) පාංශු වයනය සෙවීම ය.
(3) පාංශු ව්‍යුහ ආකාර සෙවීම ය. (4) පාංශු ජීවීන් සෙවීම ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

| 81 | S | II |
|---|---|---|

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ......................................... **කෘෂි හා ආහාර තාක්ෂණය - II** කාලය : පැය 02යි.

**I** **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
**පළමු ප්‍රශ්නයට ලකුණු 20යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.**

01. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය අතීතයේ ස්වයංපෝෂිතව පැවති අතර එම කෘෂිකාර්මික ජීවන රටාව වෙනස් මඟකට යොමු කිරීමට විදේශීය ආක්‍රමණ හේතුවිය.

(i) (a) අනුරාධපුර යුගයේ ඉදි කෙරුණු ප්‍රථම වැව කුමක් ද?
(b) එය කර වූ රජතුමා නම් කරන්න.

(ii) මින්නේරි දෙවියන් ලෙස දේවත්වයෙන් පුදනු ලැබුවේ කිනම් රජතුමා ද?

(iii) එල්ලංගා පද්ධතිය යනු කුමක්දැයි හඳුන්වන්න.

(iv) මහ වැව් ඉදිකිරීමේ තාක්‍ෂණයේ වැදගත් අංග දෙකක් නම් කරන්න.

(v) ගොවිතැන් කටයුතු නිසා ජනතාවගේ සහයෝගය එකමුතුකම තහවුරු වූ අවස්ථාවකට නිදසුනක් දෙන්න.

(vi) නුවරඑළිය මූලික කරගෙන හඳුන්වා දුන් බෝග වර්ග දෙකක් ලියන්න.

(vii) ශ්‍රී ලංකාවට නිදහස ලැබීමෙන් පසු බිහි වූ ගොවි ජනපද ව්‍යාපාර දෙකක් දක්වන්න.

(viii) බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රම වල පොදු අරමුණු දෙකක් ලියන්න.

(ix) හරිත විප්ලවය නිසා අප රටේ කෘෂිකර්මාන්තයේ සිදු වූ වෙනස්කම් මොනවාද?

(x) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය සපයන ප්‍රධාන අංශ තුන නම් කරන්න.

02. බෝග වගාවේ දී උපරිම අස්වැන්නක් ලබා ගැනීමට නම් දේශගුණික සාධක කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

(i) (a) දේශගුණය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?
(b) කාලගුණික පරාමිතීන් දෙකක් නම් කරන්න.

(ii) (a) වර්ෂාමානයක් නිවැරදිව ස්ථාපිත කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු තුනක් දක්වන්න.
(b) පහත සඳහන් ඒකක කවර කාලගුණික පරාමිති මැනීම සඳහා භාවිත කරයි ද?
1. සෙල්සියස් අංශක 2. මිලි මීටර් 3. පැයට කිලෝමීටර් 4. ලක්ස්

(iii) (a) වර්ෂාපතනය නිසා බෝගවලට සිදුවන යහපත් බලපෑම් දෙකක් හා අයහපත් බලපෑම් දෙකක් ලියන්න.
(b) වාසුළි වැසි වල දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.
(c) වාසුළි වැසි අපරටේ බහුලව දක්නට ලැබෙන මාසය කුමක් ද?

03. කාලගුණික හා දේශගුණික සාධක බෝග වගාවට හිතකර මෙන්ම අහිතකර බලපෑම්ද සිදුවේ.

(i) (a) පහත කරුණු සඳහා බලපාන දේශගුණික සාධකය නම් කරන්න.
- පරාග සේදීයාම
- පළතුරු වල පැණිරස අඩුවීම
- උත්ස්වේදනය නිසා ශාක මැලවී යාම
- ශාකවල රෝග ආසාදන වැඩිවීම

(b) ප්‍රභා අවධි සංවේදීතාව යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(ii) (a) නිල් සහ රතු වර්ණය හිතකර වන්නේ ශාකයේ කවර ක්‍රියාවලියටද?
(b) රතු ආලෝකය වැදගත් වන තවත් ශාක ක්‍රියාවන් දෙකක් දක්වන්න.

(iii) (a) සුළඟේ හිතකර බලපෑම් දෙකක් දක්වන්න.

(b) සුළඟ මගින් බාධා පමුණුවන කෘෂිකාර්මික කටයුතු දෙකක් ලියන්න.

04. දේශගුණික සාධක මෙන්ම පරිසර සාධක සමඟ වගා කටයුතු ගලපා ගැනීම බෝග වගාවේ සාර්ථකත්වයට හේතු වේ.

(i) ශ්‍රී ලංකාව බෙදා ඇති ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කරන්න.

(ii) (a) උච්චත්වය අනුව 900mට වැඩි ප්‍රදේශ හඳුන්වන නම කුමක් ද?

(b) කෘෂි පාරිසරික කලාපවලට බෙදා දැක්වීමේ දී සලකා බලන සාධක සඳහන් කරන්න.

(iii) (a) පහත සංකේතවලින් හඳුන්වන කෘෂි දේශගුණික කලාපය කුමක් ද?

* WU * IM *DL

(b) කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයේ වැදගත්කම පිළිබඳකරුණු දෙකක් දක්වන්න.

05. කෘෂිකර්මාන්තයේ දී බෝග වගා කරන ප්‍රධාන උපස්ථරය වන්නේ පසයි. පස මගින් සුවිශේෂී කාර්යයක් ඉටු කරනු ලබයි.

(i) (a) පාංශු පැතිකඩෙහි O අක්ෂරයෙන් දැක්වෙන ස්ථරයේ විශේෂ ලක්ෂණයක් ලියන්න.

(b) A ස්ථරය හැඳින්වෙන වෙනත් නමක් දෙන්න.

(ii) පාංශු පැතිකඩක් යනුවෙන් හඳුන්වන්නේ කවරක් ද?

(iii) (a) බෝග වගා කිරීම සඳහා වඩාත් සුදුසු ස්ථර මොනවාද?

(b) පාංශු ගැඹුර යනු කුමක් ද?

(c) පාංශු කාබනික ද්‍රව්‍යවල වැදගත්කම ලියා දක්වන්න.




06. පසක සිදුවන පාංශු ප්‍රතික්‍රියා බෝග වගාවලට බලපායි.

(i) (a) පාංශු ප්‍රතික්‍රියාව යනු කුමක් ද?

(b) පසක් ආම්ලික වීමට හේතු දෙකක් ලියන්න.

(ii) පාංශු ක්ෂාරීයතාවය උදාසීන කිරීමට පසට එකතු කළ හැකි ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(iii) (a) පසක PH අගය මනින ක්‍රම මොනවාද?

(b) කැටායන හුවමාරු ධාරිතාවය වැදගත්වන අයුරු පිළිබඳ කරුණු දෙකක් දක්වන්න.

07. විවිධ ලක්ෂණ පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ පස් කාණ්ඩ 14කට බෙදා දක්වා ඇත.

(i) (a) වියළි කලාපයේ පැතිර පවත්නා පස් කාණ්ඩය නම් කරන්න.

(b) දර්ශීය පස් පැතිකඩක පවතින ස්ථර දක්නට නොලැබෙන පස් කාණ්ඩය කුමක් ද?

(ii) (a) පාංශු ඛාදන ක්‍රියාවලිය ලියා දක්වන්න.

(b) පාංශු ඛාදන කාරක නම් කරන්න.

(c) දිය පහර ඛාදනය යනු කුමක් ද?

(iii) පාංශු ඛාදනයේ අහිතකර ප්‍රතිඵල දෙකක් දක්වන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

Answer

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

| 81 | S | I- II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 10 - 2019

## කෘෂි හා ආහාර තාක්ෂණය පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (1) | 11. | (3) | 21. | (3) | 31. | (1) |
| 2. | (2) | 12. | (4) | 22. | (4) | 32. | (2) |
| 3. | (3) | 13. | (3) | 23. | (1) | 33. | (2) |
| 4. | (4) | 14. | (1) | 24. | (2) | 34. | (3) |
| 5. | (1) | 15. | (3) | 25. | (4) | 35. | (4) |
| 6. | (2) | 16. | (2) | 26. | (1) | 36. | (4) |
| 7. | (3) | 17. | (1) | 27. | (3) | 37. | (1) |
| 8. | (4) | 18. | (2) | 28. | (2) | 38. | (2) |
| 9. | (2) | 19. | (3) | 29. | (3) | 39. | (3) |
| 10. | (2) | 20. | (2) | 30. | (4) | 40. | (3) |

### II පත්‍රය

01. (i) අභය වැව (ල. 01)
පණ්ඩුකාභය රජතුමා (ල. 01)

(ii) මහසෙන් රජතුමා (ල. 02)

(iii) එක වැවකින් පෝෂණය වන ප්‍රදේශය ඊළඟ වැවේ ජල පෝෂක ප්‍රදේශය ලෙස පවත්වාගෙන යනු ලබන වැව් පද්ධතිය (ල. 02)

(iv) වැව් බැම්ම, සොරොව්ව, බිසෝකොටුව (ල. 02)

(v) අත්තම් ක්‍රමය (ල. 02)

(vi) අර්තාපල්, ගෝවා, කැරට්, බීට්, රාබු, ලීක්ස් (ල. 02)

(vii) ගල් ඔය, උඩවලව (ල. 02)

(viii) කෘෂි නිෂ්පාදනය ඉහළ දැමීම, ඉඩම් නොමැති අයට ඉඩම් ලබා දීම, ජනගහන ප්‍රතිව්‍යාප්තිය, ජල විදුලිය නිපදවීම, රැකියා සැපයීම, පහළ නිම්න වල ජල ගැලීම් පාලනය, වන වගාව ව්‍යාප්ත කිරීම, පරිසර ආරක්ෂා කිරීම (ල. 02)

(ix) කෙටි කාලයක් තුළ වැඩි අස්වනු ලබා දෙන බීජ වර්ග හඳුන්වා දීම, කෘෂි රසායන ද්‍රව්‍ය හඳුන්වා දීම හා එහි භාවිතය වැඩිවීම, ගොවිපොළ යාන්ත්‍රීකරණය වැඩිවීම, කන්න දෙකක් වගා කිරීම, ලෝකයේ ධාන්‍ය නිෂ්පාදනය දෙගුණයකින් පමණ වැඩිවීම, අතිරේක නිෂ්පාදනය අලෙවි කිරීමට ප්‍රමුඛතාව ලබා දීම. (ල. 02)

(x) කෘෂි කාර්මික අංශය, කාර්මික අංශය, සේවා අංශය (ල. 02)

02. (i) (a) දීර්ඝ කාලයක් තුළ යම් ප්‍රදේශයක කාලගුණික දත්ත අධ්‍යයනය කර ඒ ඇසුරෙන් දක්වන සාමාන්‍ය පරිසර තත්ත්වය (ල. 01)

(b) වර්ෂාපතනය, උෂ්ණත්වය, ආලෝකය, සාපේක්ෂ ආර්ද්‍රතාව සුළඟ වැනි පිළිතුරු 02ක් සඳහා (ල. 1/2 5 2 - 01)

(ii) (a) නිවැරදි පිළිතුරු තුනක් සඳහා (ලකුණු 1/2 5 3 = 1 1/2)

(b) 1. උෂ්ණත්වය 2. වර්ෂාපතනය 3. සුළගේ වේගය 4. ආලෝක තීව්‍රතාවය (ලකුණු 1/2 5 4 = 02)

(iii) (a) යහපත් බලපෑම් දෙකක් සඳහා (ලකුණු 1/2 5 2 = 01)
අයහපත් බලපෑම් දෙකක් සඳහා (ලකුණු 1/2 5 2 = 01)

(b) තද සුළං ඇතිවීම, නොකඩවා දින කීපයක් ඇද හැලෙන වර්ෂාව (ලකුණු 02)

(c) දෙසැම්බර් (ලකුණු 1/2)

03. (i) (a) පරාග සේදී යාම - වර්ෂාපතනය.

පලතුරුවල පැණි රස අඩුවීම - වර්ෂාපතනය
උත්ස්වේදනය නිසා ශාක මැලවීයාම - උෂ්ණත්වය
ශාකවල රෝග ආසාදන වැඩිවීම - ආර්ද්‍රතාවය (ලකුණු 1/2 5 4 = 2)

(b) පුෂ්ප හට ගැනීමේදී දිවා කාලයේ දිග කෙරෙහි ශාක දක්වන ප්‍රතිචාරය (ලකුණු 01)

(ii) (a) ප්‍රභාසංස්ලේෂණය (ලකුණු 01)
(b) අතු බෙදීමට, බීජ ප්‍රරෝහණයට (ලකුණු 02)

(iii) (a) මඳ සුළඟින් ශාක පත්‍රවල වායු හුවමාරුව පහසු කරවන බැවින් ප්‍රභාසංස්ලේෂණය වැඩි වී අස්වනු වැඩිවේ.
මඳ සුලඟ ශාකවල පරාගනයට දායක වේ.
උත්ස්වේදනය වේගය වැඩි වී ශාක පෝෂක අවශෝෂණය වැඩිවේ. (ලකුණු 02)
(b) කෘෂි රසායන ද්‍රව්‍ය ඉසීමට, විසුරුම් ජල සම්පාදනයට (ලකුණු 02)

04. (i) තෙත්, අතරමැදි, වියලි (ලකුණු 1 5 3 = 03)
(ii) (a) උඩරට (ලකුණු 01)
(b) භූ විෂමතාව, පස් වර්ගය, භූමි භාවිතය (ලකුණු 1/2 5 2 = 01)
(iii) (a) WU - උඩරට තෙත්
IM - මැදරට අතරමැදි
DL - පහතරට වියලි(ලකුණු 1 5 3 = 03)
(b) සමාකාර දේශගුණික තත්ව ඇති ප්‍රදේශ හඳුනා ගත හැකිවීම, ඒ ඒ කලාපයට සුදුසු බෝග නිර්දේශ කිරීම, ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණ කටයුතු පහසුවීම ආදී නිවැරදි කරුණු 02ක් සඳහා (ලකුණු 1 5 2 = 02)

05. (i) (a) කළු පැහැයෙන් යුක්තවීම, කාබනික ද්‍රව්‍ය බහුලවීම එක් පිළිතුරක් සඳහා (ලකුණු 01)
(b) විශෝධන කලාපය (ලකුණු 01)
(ii) පස මතුපිට සිට මව් පාෂාණය දක්වා පාංශු කලාප පෙන්නුම් කරන පසේ සිරස් කඩක් (ලකුණු 02)
(iii) (a) O ස්ථරය
A ස්ථරය (ස්ථර දෙකක් නම් කිරීමට
B ස්ථරය (ලකුණු 02)
(b) A, B හා C කලාපවල මුළු උස (ලකුණු 02)
(c) අදාළ නිවැරදි පිළිතුරු දෙකක් සඳහා (ලකුණු 02)

06. (i) (a) පසේ ආම්ලිකතාවය හෝ භාෂ්මිකතාව (ලකුණු 02)
(b) පසේ ඇති $Na^+$ , $Ca^{++}$ වැනි භාෂ්මික අයන ක්ෂරණය වීම
කාබනික ද්‍රව්‍ය වියෝජනය වීමේ දී කාබනික අම්ල නිතර පසට එක්වීම
අම්ල වැසි ඇතිවීම (කරුණු දෙකක් සඳහා (ලකුණු 02)
(ii) ජිප්සම්, ගෙන්දගම්, කාබනික ද්‍රව්‍ය (ද්‍රව්‍ය දෙකක් සඳහා (ලකුණු 02)
(iii) (a) PH කඩදාසි, PH මීටර (ලකුණු 02)
(b) පොහොර ලෙස පසට යොදන පෝෂක රඳවා තබා ගැනීම, අවශ්‍ය විට පාංශු ද්‍රාවණයට අයන මුදා හැරීම, පස සාරවත් වීම. (කරුණු දෙකක් සඳහා (ලකුණු 02)

07. (i) (a) රතු දුඹුරු පස (ලකුණු 01)
(b) දියළු පස (ලකුණු 01)
(ii) (a) පාංශු දේහයෙන් පාංශු අංශු හා සමුහන වෙන්වීම
වෙන් වූ පාංශු සමුහන හා පාංශු අංශු වෙනත් ස්ථානයක් වෙතට ගසාගෙන යාම,
ගසාගෙන ආ පාංශු කොටස් වෙනත් ස්ථානයක තැන්පත් වීම. (ලකුණු 1 5 3 = 03)
(b) වර්ෂා ජලය, වේගවත් සුළඟ, මුහුදු රළ, හා ගංගා රළ මිනිස් හා සත්ත්ව ක්‍රියාකාරකම් (කරුණු 02ක් සඳහා ලකුණු 02)
(c) ඇළ, දොළ, ගංගා ආදියෙහි ඉවුරු සහ පතුල සේදී යාම (ලකුණු 01)

(iii) ශාක වර්ධනය සඳහා සුදුසු පාංශු ස්තරයේ ඝනකම අඩුවීම.
ශාක පෝෂණ ඌනතාවලට ගොදුරු වී වර්ධනය බාලවීම
මුල මණ්ඩල අවට පස් සේදී යාම නිසා ගස් ඇද වැටීම.
කෘෂිකාර්මික ඉඩම් වල වටිනාකම අඩුවීම,
ඉවත් වන පස් ජලාශ වල තැන්පත්වීම නිසා ඒවා ගොඩ වී ගංවතුර ඇතිවීම.
(කරුණු දෙකක් සඳහා ලකුණු 02)